

මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ලක්ෂ සංඛ්‍යාත ගොවි පවුල් වෙත සෙත සැලසෙන
සුවිශාලතම බහු කාර්ය සංවර්ධන ව්‍යාපාරය

ජල දුක නිවන - ජන සෙත සදන

# මොරගහකන්ද මහා වාරි ප්‍රාතිහාර්යය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
MORAGAHAKANDA - KALUGANGA - DEVELOPMENT PROJECT

# මොරගහකන්ද කළුගඟ යෝධ වාරි ව්‍යාපාතිය
## ශක්‍යතා අධ්‍යයනය

1950 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව මහවැලි ගංගා ජලය ප්‍රයෝජනයට ගැනීමේ මූලික අධ්‍යයන කටයුතු කිරීම.

1954 - කැනේඩියානු ජාත්‍යන්තර සහයෝගිතා අධ්‍යයන ආයතනයේ (Clombo Plan) ආධාර ඇතිව මහවැලි ගංගාවේ ජලය ප්‍රයෝජනයට ගැනීමට ප්‍රධාන හැරවුම් ස්ථාන අධ්‍යයනය කළ අතර, ප්‍රථම වරට මොරගහකන්ද හැරවුම් වේල්ලක් සැලසුම් කරන ලදි.

1958 - 1962 - ඇමරිකන් එක්සත් ජනපදයේ මෙහෙයුම් මධ්‍යස්ථානවල (USOM) වර්තමාන (USAID) ආයතනය මොරගහකන්ද ජලාශය හා සෙසු ජලාශ පිළිබඳ සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීම.

1963 - ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහවැලි ගංගාවේ ජලාශය ප්‍රයෝජනයට ගැනීම සඳහා අධ්‍යයනයක් කිරීමට ආරාධනා කරන ලදි.

1964 - 1968 - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා ලෝක ආහාර සංවිධානය (UNDP/FAO) එක්ව මහවැලි සංවර්ධන මහ සැලැස්ම ආරම්භ කරන ලදි.

1979 - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) අනුග්‍රහයෙන් මොරගහකන්ද කළුගඟ ව්‍යාපාතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම.

1989 - ඉහත අධ්‍යයනය වාර්තාව නැවත යාවත්කාලීන කිරීම.

1996 - කුවේට් රජයේ ආධාර ඇතිව මොරගහකන්ද ජලාශය පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම.

1997 - මොරගහකන්ද ජලාශ ව්‍යාපාතියේ පරිසර බලපෑම් පිළිබඳ (TEAMS) වාර්තාව එළි දැක්වීම.

2000 - ජර්මනියේ (LAHMEYER) අන්තර්ජාතික උපදේශන සමාගම ශ්‍රී ලංකාවේ ඉංජිනේරු කාර්යයන් පිළිබඳව මධ්‍ය උපදේශන කාර්යාංශය සමඟ එක්ව ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කිරීම.
වත්මන් මොරගහකන්ද කළුගඟ ව්‍යපෘතියට පාදක වී ඇත්තේ මෙම ශක්‍යතා අධ්‍යයනය වේ.

2007 ජනවාරි 25 ආරම්භ කළ මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය නිසි කලට නිම වූයේ නම්
2013 සිට වියළි කලාපීය බහුතර ජනතාව මුහුණ දුන් නියඟ තත්ත්වය හා අනෙකුත් බොහෝ පීඩාවන් අවම වන්නට ඉඩ තිබුණි.




| | |
|---|---|
| පරි. අංක | 6729 |
| වර්ග අංක | 627.52 |
| දිනය | |


# පරපුරක් දුටු ආශ්චර්යයේ සිහිනය

මහවැලි ගංගාව සහ එහි පරිවාර ශාඛාවන් ඔස්සේ කල්පාන්තරයක් පුරා මහ සමුදුර වෙත නිරර්ථකව ගලා ගිය ජල ධාරාවන්ගේ ගමන් මග මහවැලි සංවර්ධන සැලැස්මත් සමග අර්ථවත් අරමුණක් වෙත පෙළ ගැසුණේය.

එහි ප්‍රතිලාභ වර්තමානය විසින් අත්විඳිමින් සිටී.

ජල හිඟයෙන් අනන්ත දුක් පීඩා විඳ හුරුපුරුදු වියළි කලාපීය වැසියන්ගේ සුවිසල් අපේක්ෂාවක් වූ මොරගහකන්ද වාරි සිහිනය දිගුකලක් සිහිනයක් ලෙසම පැවතියේ විවිධ බාධකවල හැපෙමිනි.

අසීරු අභියෝග හමුවේ වුව අවසන 2007 වසරේදී මොරගහකන්ද වාරි ව්‍යාපෘතිය මල්ඵල ගැන්වීමට හැකි වූ අතර අද වන විට එම සිහිනය මහපොළොව මත යථාර්ථයක් බවට පත් වී තිබේ.

මොරගහකන්ද කළුගඟ යෝධ ජලාශ ද්විත්වය තුළ රැස් වන්නේ අනාගත ශ්‍රී ලාංකීය සෞභාග්‍යයේ මහා ධනනිධානය බව මාගේ විශ්වාසය යි.

කල්ප කලාන්තරයක් පුරා නිරර්ථකව ගලා ගිය අඹන් ගඟ මෙතැන් සිට අනුරාධපුර, මාතලේ, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල වාරි සහ පානීය ජල හිඟය නිවාරණය කරනු ලබන අමාදිය ධාරාවක් බවට පත්ව අප මාතෘභූමියේ සංවර්ධන ක්‍රියාවලියට ජවසම්පන්න උත්තේජනයක් සපයනු ඇත.



මොරගහකන්ද යනු මෙතැන් සිට අනාගත සෞභාග්‍යයේ දිසානතිය වනු නිසැකය. මෙම උත්තුංග ව්‍යායාමය සාක්ෂාත් කරගනු උදෙසා දායක කාරක වූ, ගම් බිම් පූජා කළ, ශ්‍රමය වැගිරූ සැමට මාගේ කෘතවේදීත්වය පිරිනමමි.

2017 ජනවාරි මස 05 වන දින

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති



**මුළු ව්‍යාපෘති වියදම - ඇ.ඩො.මි. 1207.5 (රුපියල් කෝටි 18100) ක් පමණ**

මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය - ඇ.ඩො.මි. 557.5

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ඉහළ ඇලහැර ව්‍යාපෘතිය

| | |
|---|---|
| 1. මොරගහකන්ද සිට මහකනදරාව දක්වා | ඇ.ඩො:මි. 450 |
| 2. වයඹ සංවර්ධන ඇළ | ඇ:ඩො.මි. 200 |
| 3. මිනිපේ වම් ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා | ඇ.ඩො.මි. 25 |

## මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය ඇරඹීමේ තිත්ත ඇත්ත

පොල්ගොල්ල ජලාශය නිම කිරීමෙන් අනතුරුව එවකට වාරිමාර්ග විදුලිබල හා මහා මාර්ග අමාත්‍ය මෛත්‍රීපාල සේනානායක මහතා උතුරු මැද, පදවිය සහ උතුරු ප්‍රදේශයට ජලය ගෙන යාම සඳහා මොරගහකන්ද ජලාශය ඉදිකිරීමට උත්සහ කළත් පටු ජාතිවාදීන් ඊට බාධා කරන ලදී. 1977 බලයට පත් රජයේ විදුලිබල හා වාරි මාර්ග සහ මහවැලි සංවර්ධන අමාත්‍යතුමන් තම දේශපාලන ගමන් මගේ ප්‍රමුඛතා ලේඛණයට අනුව විදුලි බල නිෂ්පාදනයට මුල්තැන ලබාදෙමින් වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, කොත්මලේ ජලාශ ඉදිකළ අතර, මොරගහකන්ද ජලාශ ඉදිකිරීමට නොහැකි විණි. 1989 එම තත්ත්වය අවබෝධ කරගත් වත්මන් ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තම මැතිවරණ වේදිකාවල මොරගහකන්ද ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නිර්භීත නායකත්වය දෙන බව ප්‍රකාශ කළ අතර 1994 බලයට පත්වීමත් සමඟ ශක්‍යතා අධ්‍යයනය වාර්තා පරීක්ෂාවෙන් අනතුරුව ජලාශය ඉදිකිරීමට මූලික පිඹුරුපත් සකස් කරන ලදී. එහෙත් මහවැලි අධිකාරියේ ප්‍රති ව්‍යුහගතකරණ ක්‍රියාවලිය නිසා එය ප්‍රමාද විය.

1998 දී මහවැලි සංවර්ධන අමාත්‍යධුරයට පත් වත්මන් ජනාධිපතිතුමා පත්වීමත් සමඟ එතෙක් පැවති සියළුම බාධා ජය ගැනීමට හැකි වූ අතර, මොරගහකන්ද ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ මෙහෙයුම් කාර්යාලයක් පිහිටුවා සියළු ශක්‍යතා අධ්‍යයන නිමකර 2007 ජනවාරි මස 25 වන දින අති උත්කර්ෂවත් අන්දමින් එවකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ හා වත්මන් ජනපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මූලික කටයුතු ආරම්භ කරන ලදී.

මෙය ඓතිහාසික සංසිද්ධියක් වූ අතර, ලංකාවේ ඉදිවන විශාලතම ගබඩා ජලාශ සංකීර්ණය පිළිබඳ සිහින දකිමින් සිටි අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ මාතලේ ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවක් එම උත්සවයට සහභාගී වීම තුළින් ප්‍රකට වූයේ මෙම වාරි ව්‍යාපෘතිය ඔවුන්ගේ ජීවිතවල දැවැන්තම අපේක්ෂාව බවයි.

මෙම තත්ත්වයන් මත එවක දේශපාලන නායකත්වයට මෙම ජන ගඟ දුටු විට ඇති වූ ආකල්පවල ප්‍රතිඵලයක් ලෙස 2009 සිදු වූ කැබිනට් සංශෝධනයෙන් ලංකාවේ වැඩිම භූමි හා ජලයට ආධිපත්‍යයක් දරණ මහවැලි අමාත්‍යධුරය ක්ෂණිකව වෙනස් විය. 2009 සිට 2015 දක්වා අරමුදල් ලබාදීම ද මන්දගාමී වූ අතර, ප්‍රාදේශීය සංවර්ධන කටයුතු පසෙක තබා මහා ව්‍යාපෘතිවලට මුදල් වැය කිරීම මගින් ජනතාව නොසලකා හැරීමේ තත්ත්වයක් ද දක්නට ලැබිණි. 2015 වන විට ගංගා නිම්නයෙන් පෝෂණය වී හැදී වැඩුනු ගොවි පරපුරක දරුවෙකු ශ්‍රී ලංකාවේ ජනාධිපති ධූරයට පත්වීම මහවැලි නිම්නයේ ජනතාව ලැබූ භාග්‍යයක් විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ මොරගහකන්ද කළුගඟ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතිය යථාර්ථයක් බවට පත්වීමයි.

"මම රජරටටත් රජ රැටියන්ටත් ආදරය කරමි. ඔවුහු මාගේ ඥාතින් ද අසල් වැසියන් ද හිතවතුන් ද වෙති. එහෙයින් මම ඔවුනටත් ඔවුන්ගේ නිජබිමටත් උපන් දේශයටත් ආදරය කරමි."

ඒ අසීමිත මොරගහකන්ද නිම්නය නිල් දියවරින් පිරි ජල තටාකයක් බවට පත් වෙමින් අද රළ රැළි නගන්නේ ඒ අසීමිත ආදරයයි.



## රන්දියවර මංගල්‍ය

මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඉදිකරනු ලබන මොරගහකන්ද ජලාශයේ ජලය ගබඩා කිරීමේ කටයුතු 2017.01.11 වන දින සුභ මොහොතින් ආරම්භ විය. දශක ගණනාවක් පුරා පහළ නිම්න ප්‍රදේශයේ මනම්පිටිය - සෝමාවතිය ඇතලු අවට ප්‍රදේශයන්හි බව භෝග සහිත වගා බිම් මෙන්ම, සතා - සිව්පාවාගේ මෙන්ම, මනුෂ්‍ය ජීවිත හා දේපළ හානිකරමින් මහත් විනාශයන් ගෙනදුන් ජලකඳ මෙල්ල කරමින් රන්දියවරක් බවට පත් කිරීමේ හැරවුම් ලක්ෂයක් බවට පරිවර්තනය කිරීම ද මෙමඟින් සිදුකරනු ලබයි.

එමෙන්ම කාලාන්තරයක් පුරා ඵලදායී කටයුත්තකට නොගෙන මහසයුරට ගලාගෙන ගිය ඝණ මීටර් දසලක්ෂ 818ක ජලස්කන්ධයට නව වටිනාකමක් ලබාදෙමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් හුරුළුවැව, තිසාවැව, නුවරවැව, නාච්චිදූව, මහකනදරා වැව යනාදී ජලාශ මෙන්ම ඉන් පෝෂණය වන ලොකු කුඩා වැව් සිය දහස් ගණනකට මෙන්ම තිරසාරව ජලය සැපයීමට මෙමඟින් හැකිවනු ඇත. එමෙන්ම සංවර්ධනය කෙරෙන මැදිරිගිරිය නව සංවර්ධන කලාපයේ අක්කර 12,000ක පදිංචි ජනතාවගේ ජීවනෝපාය තිරසාරව සකස් කරමින් ඉහත දැක්වූ ප්‍රදේශ ඇතුළුව පවුල් 136,000කට පමණ වසර පුරා අවශ්‍ය වාරි ජලය සැපයීම මෙන්ම මාතලේ සහ නැගෙනහිර පළාත් ද ඇතුළුව පිරිසිදු පානීය ජලය ලබාදීමට මෙම ව්‍යාපෘතිය මඟින් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.



# ව්‍යාපෘති පසුබිම

මහවැලි මහ සංවර්ධන සැලැස්මට අයත් බෝහෝ ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මකව පැවතිය දී මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය දශක හතරකට ආසන්න කාලයක් විවිධ හේතූන් මත ප්‍රමාදයට පත් විය. ඒ තුළ විශේෂයෙන්ම අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල ප්‍රදේශ ඇතුළත් වියළි කලාපීය ගොවි ජනතාවගේ කඳුළු කතාවට ද විසඳුම් ලබාදීම ප්‍රමාද විය. වාරි ජලය, පානීය ජලය ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතාවයක් විය. තත්වය මෙසේ පැවතීම මත කෘෂිකර්මය ගරා වැටුණි. වකුගඩු ආදී රෝග උත්සන්න වුණි. මේ පසුබිම් තුළ ඔවුන්ගේ ආර්ථිකය ද කඩා වැටීම දක්නට ලැබුණි.




ආචාර්ය කේ. එන්. එස්. කුලසිංහ මහතා සමග මූලික ගවේශන කටයුතු සිදුකල අවස්ථා

මෙයට විසඳුම් සොයන්නට සමකාලීන දේශපාලනයේ නියුතු වූ එවකට කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යවරයා ලෙස ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගන්නා ලද දැඩි උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස එවකට හිටපු ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සහභාගීත්වයෙන් 2007 ජනවාරි 25 වන දින උත්සවාකාරයෙන් මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හැකි විය.

අද්දවන විට එතුමන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා ලෙස තෝරා ගැනීම තුළ ව්‍යාපෘතිය කඩිනම් කරමින් සක්‍රීය දායකත්වයක් ලබාදීමට හැකිවීම රජරට ගොවි ජනතාවගේ සහ අප ලද භාග්‍යක් කොට සලකමු.





## ව්‍යාපෘතියේ ප්‍රධාන අංග

### මොරගහකන්ද ජලාශය

ජලාශ ධාරිතාවය - ඝන මීටර් මිලියන 570

| වේලි වර්ගය | උස (මීටර්) | දිග (මීටර්) |
|---|---|---|
| පස් පුරවන ලද ගල් වේල්ල (ප්‍රධාන වේල්ල) | 61.3 | 470 |
| කොන්ක්‍රීට් (RCC) වේලි අංක 01 | 58.0 | 375 |
| පස් වලින් සැදුම් ලත් සැදලි වේලි අංක 02 | 21.5 | 275 |

## අරමුදල්

මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන වේලි හා විදුලි බලාගාරයන් ඉදිකිරීම

1. චීන සංවර්ධන බැංකුව 85% - රු.මි. 28952.1 (ඇ.ඩො.මි. 214.46)
2. දේශීය අරමුදල් 15% - රු.මි. 4920.5 (ඇ.ඩො.මි. 37.85)

## කළුගඟ ජලාශය

ජලාශ ධාරිතාවය - ඝන මීටර් මිලියන 248

| වේලි වර්ගය | උස (මීටර්) | දිග (මීටර්) |
|---|---|---|
| පස් පුරවන ලද ගල් වේල්ල (ප්‍රධාන වේල්ල) | 68 | 568 |
| සැදලි වේල්ල | 28 | 719 |

## මොරගහකන්ද කළුගඟ ජලාශ සම්බන්ධ කරන උමග සහිත ඇළ මාර්ගය

- සම්බන්ධිත උමං මාර්ගය : දිග - කි.මි. 7.85
- සම්බන්ධිත ඇළ මාර්ගය : දිග - මීටර් 472
- ධාරිතාවය : තත්පරයට ඝන මීටර් 35
- ගිනිපෙට්ටි පාලම (Aqueduct) 02
- මොරගහකන්ද හා කළුගඟ ප්‍රධාන විකල්ප මාර්ගයක්
- ඉහළ ඇළහැර ඇළ
- ලග්ගල හා බිසෝපුර නව සංවර්ධන ප්‍රදේශ ලෙස දියුණු කිරීම.





කර්කශව පැවති සාරවත් බිමට ජලය ලබාදීමත් වකුගඩු රෝග හා අනෙකුත් රෝග පීඩාදියෙන් මතු පරපුර ආරක්ෂා කර ගැනීම සඳහා පිරිසිදු පානීය ජලය සැපයීමත් පහළ නිම්න ප්‍රදේශයේ දහස් ගණන් වාර්ෂිකව අනාථයන් බවට පත්කරන ගංවතුර (මනම්පිටිය, සෝමාවතිය) වළකාලමින් එකී ජනතාව වෙත ස්ථිරසාර විසඳුමක් ලබාදීමත් ජනතාව මෙම ව්‍යාපෘතිය මගින් ලබන විශාල ජයග්‍රහණයන් වනු ඇත. එමෙන්ම පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාවේ අඩංගු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තුළ පාරිසරික බලපෑම් අවම කිරීම ද ව්‍යාපෘතියේ විශේෂ ලක්ෂණයකි.

ව්‍යාපෘතියේ මූලික ඉංජිනේරුමය ඉදිකිරීම්වලින් අනතුරුව පළමු අදියරේ දී අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික්කයන්හී හෙක්. 82,000 ක පමණ විශාල භූමි ප්‍රමාණයක් සඳහා වසරේ දෙකන්නයේම සාර්ථකව වගා කළ හැකි පරිදි වාරි ජලය සැපයීම සහතික කරනු ලැබීමත්, පානීය හා කර්මාන්ත සඳහා ජලය සැපයීමත් සිදු කෙරේ. මේ තුළ නව කෘෂිකාර්මික භූමි ප්‍රදේශයක් ලෙස හෙක්. 12,000ක් පමණ (කළුගඟ පහළ නිම්න ප්‍රදේශය හා මැදිරිගිරිය බිසෝපුර ප්‍රදේශය) සංවර්ධනය කෙරෙමින් පවතී. මේ හැර වයඹ සංවර්ධන ව්‍යාපෘතිය මගින් හෙක්. 12,500කට පමණ දියවර සැපයේ.

දේශීය අරමුදල් යොදාගනිමින් මොරගහකන්ද ජලාශයේ සැදලි වේල්ල අංක 02 හි වැඩ සම්පූර්ණයෙන්ම නිම කර ඇත. මොරගහකන්ද ප්‍රධාන වේල්ල, උප වේලි අංක 01 හා එයටම සම්බන්ධ වන ජල විදුලිබලාගාරය ඉදිකිරීම් සඳහා චීන සංවර්ධන බැංකුවෙන් මූල්‍ය ණය ආධාර ලැබී ඇති අතර, එහි ඉදිකිරීම් කටයුතු දේශීය ඉංජිනේරුවන්ගේ අධීක්ෂණය හා දායකත්වයෙන් සුප්‍රකට චීන සමාගමක් වන Sinohydro Corporation ආයතනය විසින් සිදුකර අවසන් වෙමින් පවතී.

එම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 32,800 (ඇ.ඩො.මිලියන 252.3) වන කොන්ත්‍රාත්තුව 2012 ජූලි මස ආරම්භ කරන ලදි. 2017 වර්ෂයේ ජූනි වන විට සියළු ඉදිකිරීම් අවසන් කිරීමට නියමිතව ඇත. කළුගඟ ජලාශයේ ඉදිකිරීම් කටයුතු සඳහා කුවේට් සංවර්ධන අරමුදල, සවුදි සංවර්ධන අරමුදල හා ඔපෙක් ජාත්‍යන්තර අරමුදල එක්ව මූලාධාර ලබා දී ඇත. එහි ඉදිකිරීම් 2014 වසරේ අප්‍රේල් 02 වන දින ආරම්භ කළ අතර එහි වේල්ල ඉදිකිරීම් 2018.12.12 වන විට අවසන් කිරීමට නියමිතව ඇත.

මෙයට අමතරව මොරගහකන්ද හා කළුගඟ ජලාශයන්හි ඉදිකිරීම් සඳහා ඉවත් කිරීමට සිදුවන පවුල් 3,000 ක් පමණ නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය නව පරිපාලන නගර, ග්‍රාමීය මංමාවත්, වාරි පද්ධතිය ඇතුළු අවශ්‍ය සියළු යටිතල පහසුකම් මෙන්ම කළුගඟ යටතේ සංවර්ධනය වන හෙක්. 3,000 ක භූමියක් සහ කවුඩුල්ල ජලාශය යටතේ හෙක්. 9,000 ක පමණ භූමියක් සංවර්ධනය අවසන් කරමින් පවතී.

ව්‍යාපෘතිය මඟින් සැලසුම්කර ඇති අයුරින් 2016 වර්ෂය අවසන් වන විට මොරගහකන්ද ව්‍යාපෘතියට අදළව ඉවත් කරන පවුල් පදිංචි කිරීම් අවසන් කරන අතර, 2017 වන විට කළුගඟ ව්‍යාපෘතියට අදළව ඉවත් කරන පවුල් පදිංචි කිරීමට නියමිතව ඇත. එමෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය වීම තුළ ප්‍රදේශයේ නවීකරණය මෙන්ම සීඝ්‍ර සංවර්ධනයක් කරා යොමුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, ප්‍රදේශයේ පැවති කිසියම් ආකාරයක හුදකලා බව දුරස් වෙමින් නවීන ලෝකයේ යහවාදී ආස්වාදය ප්‍රදේශයේ සියළු ජනතාව වෙත ලබාදීම අප සියළුදෙනාගේ ඒකායන පරමාර්ථය බව සඳහන් කරමු.







## නැවත පදිංචි කරන්නන් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ අනෙකුත් පහසුකම් සැපයීම

- ව්‍යාපෘතියේ හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සංඛ්‍යාව 3000 ක් පමණ වේ.
- එම සියලුම පවුල් වලට අහිමි වන දේපල සඳහා වන්දි මුදල් ගෙවනු ලබයි.
- සෑම පවුලක් සඳහාම ගොඩ ඉඩම් අක්කර 1/2 ක් හා වාරි ඉඩම් අක්කර 1 1/2 ක් බැගින් ලබාදීම.
- වාණිජ ව්‍යාපාර හා කර්මාන්ත අහිමි වන්නන් සඳහා නව වාණිජ හා කර්මාන්ත ඉඩම් ලබාදීම.
- සෑම පවුලකටම නව ඉඩම් සංවර්ධනය සඳහා කෘෂි මෙවලම් කට්ටලයක් ලබාදීම.
- නව ඉඩමෙහි තාවකාලික නිවසක් හා වැසිකිළියක් ඉදිකර ගැනීමට රු. 50,000.00 ක දීමනාවක් ලබාදීම.
- ලබාදෙන වාරි ඉඩමේ පළමු අස්වැන්න ලබාගන්නා තෙක් සෑම පවුලක් සඳහාම මාසික වියළි ආහාර සලාකයක් ලබාදීම.
- නව ඉඩමේ වගා කටයුතු සඳහා කෘෂි බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම.
- නව ජනපදිකයින්ට විකල්ප ආදායම් උත්පාදන මාර්ග හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අමතර පුහුණු කිරීම් හා මූල්‍ය සහය ලබාදීම.
- නැවත පදිංචි කරනු ලබන සෑම ගම්මානයකටම විදුලි බල පහසුකම් සැපයීම.
- සෑම නිවසක් සඳහා ම නල ජල පහසුකම් සපයන ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.




- සෑම නිවසකටම පිවිසුම් මාර්ග ඇතුළත්ව මාර්ග පද්ධතියක් සකස් කිරිම.
- බලපෑමට ලක්වන ප්‍රදේශ වල සියලු පොදු සේවා සැපයෙන පොදු පහසුකම් හා පෞද්ගලික ආයතන සහිත අංග සම්පූර්ණ නව නගරයක් ලෙස නව ලග්ගල නගරය සංවර්ධනය කිරිම.
- නව අධ්‍යාපන සංකල්පය මත සැලසුම් කළ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම.
- ප්‍රජා ශාලා, ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන, උප තැපැල් කාර්යාල, සමූපකාර ආදි අනෙකුත් පොදු පහසුකම් සැපයීම.
- නව ජනපදිකයින් සඳහා රැකියා අවස්ථා උදවන කර්මාන්ත පුරයක් ඉදිකිරිම.










**නව විදුලිබල**

ජාතික විදුලිබල පද්ධතියට එකතුවන ටර්බයින 4කි
මෙගා වොට් 25ක ධාරිතාවය සහිත ජල විදුලිබලාග




- මොරගහකන්ද කළුගඟ ජලාශයන්හී සම්පූර්ණ ධාරිතාවය අක්කර අඩි 660,000ක් එනම් පරාක්‍රම සමුද්‍රයේ ජලධාරිතාවය මෙන් 6 ගුණයක් විශාලය
- ඉහළ ඇළහැර ව්‍යාපෘති ඇළ මහකනදරාව දක්වා දිග කිලෝමීටර් 94යි. (කිලෝමීටර් 26ක් සහිත උමංමාර්ග)
- වයඹ සංවර්ධන ඇළ කිලෝමීටර් 93යි.
- කළුගඟ සිට මොරගහකන්ද දක්වා ඇළමාර්ගය කිලෝමීටර් 9යි. (කිලෝමීටර් 7.85ක් සහිත උමංමාර්ග)

මෙම ව්‍යාපෘතිය මගින් පෝෂණය වන ලොකු කුඩා වැව් සංඛ්‍යාව


අනුරාධ

- ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය මගින් - 1200
- වයඹ සංවර්ධන ව්‍යාපෘතිය මගින් - 303
- මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශය තුල - 32
- ලග්ගල සංවර්ධන ප්‍රදේශය තුල - 16



## ජලයෙන් ප්‍රතිලාභ ලබන ප්‍රදේශ

ර දිස්ත්‍රික්කය, පොළොන්නරුව දිස්ත්‍රික්කය, මාතලේ දිස්ත්‍රික්කය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය, ඉහත සඳහන් ප්‍රදේශයන් හී වාරි ජලය වසර පුරා ගොවිතැන් කටයුතු සඳහා සැපයීමත් පිරිසිදු පානීය ජලය ලබා දෙමින් ජනතාව සමෘද්ධිමත් මෙන්ම නිරෝගීමත් පරපුරක් බවට පරිවර්තනය කිරීම ද ව්‍යාපාතියේ මූලික අපේක්ෂාවන් වූ බව සඳහන් කරන්නෙමු.



## ව්‍යාපෘති ප්‍රදේශය

ව්‍යාපෘතියේ මූලික ඉදිකිරීම් හා නැවත පදිංචි කිරීම් වලින් වැඩි කොටසක් මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල සහ ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් වේ.

## ව්‍යාපෘති ක්‍රියාත්මක කාල සීමාව

සැලසුම් හා ඉදිකිරීමේ කාලය ඇතුළුව ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ කාල පරිච්ඡේදය වසර 10 ක් වන අතර, එය 2007 ජනවාරි 25 ආරම්භ විය.

## ක්‍රියාවට නැංවීමේ වගකීම

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදු කෙරේ.

## ව්‍යාපෘතියේ අංගයන්

- මොරගහකන්ද හා කළුගඟ ලෙස ප්‍රධාන ජලාශ 2ක්
- එම ජලාශ සම්බන්ධ කෙරෙන උමග සහිත ඇල මාර්ගයක්
- මෙගා වොට්ස් 2.5ක ධාරිතාවයෙන් යුත් විදුලි බලාගාරයක්
- මොරගහකන්ද හා කළුගඟ ප්‍රධාන විකල්ප මාර්ගයන්
- ඉහළ ඇළහැර ඇළ
- ලග්ගල සහ බිසෝපුර නව සංවර්ධන ප්‍රදේශයන් ලෙස දියුණු කිරීම.





2016.07.25 දින
කළුගඟ ජලාශ වේල්ල ඉදිකිරීම්
ආරම්භ කරමින්
ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා,
මැති ඇමතිවරුන්
සමඟ නිධන් වස්තු තැන්පත් කරමින්
දයක වූ අයුරු



## කළුගඟ ජලාශයේ ප්‍රධාන වේලි ඉදිකිරීම

1. කුවේට් සංවර්ධන අරමුදල - රු.මි. 4883.03 (ඇ.ඩො.මි.33.13)
2. සෞදි සංවර්ධන අරමුදල - රු.මි. 6779.94 (ඇ.ඩො.මි.46)
3. ඔපෙක් ජාත්‍යන්තර අරමුදල - රු.මි. 2358.24 (ඇ.ඩො.මි.16)
4. දේශීය අරමුදල - රු.මි. 2434.28 (ඇ.ඩො.මි.16.52)

# සෘජු ප්‍රතිලාභ

## කෘෂිකාර්මික සංවර්ධනය

හෙක්. 82,000 ක් සඳහා යල මහ දෙකන්නයේ ජලය සැපයීමට හැකිවීම. විවිධ ප්‍රදේශවල 100% සිට 154% දක්වා වන වගා තීව්‍රතාවයේ සාමාන්‍ය අගය 181% දක්වා ඉහළ නැංවේ. මෙහි සෘජු ප්‍රතිලාභයක් ලෙස හෙක්ටයාරයකට ලැබෙන වී අස්වැන්න ඉහළ යන අතර, අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයට විශාල දායකත්වයක් සපයනු ඇත. මුළු කෘෂිකාර්මික වාර්ෂික ප්‍රතිලාභය රු.මි. 4,000 ක් පමණ වෙතැයි ගණන් බලා ඇත.

## මිරිදිය මත්ස්‍ය සංවර්ධනය

ජලාශයෙන් වාර්ෂිකව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන හැකියාව ටොන් 3,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එහි වටිනාකම රු. මි. 225 ක් පමණ වේ.

## විදුලි බල උත්පාදනය

මෙමගින් වාර්ෂිකව ඉතිරි කෙරෙන ඉන්ධන පිරිවැය රු. මි. 336 ක් පමණ වේ.















රිවස්ටන් - පුංචි ලෝකාන්තය (පසුබිම)
මොරගහකන්ද ජලාශය පෙනෙන දසුන

## අමතර ප්‍රතිලාභ

වස්ගමුව වනෝද්‍යානය, ගිරිතලේ - මින්නේරිය වනෝද්‍යානය, නකල්ස් කඳුවැටිය ආශ්‍රිත රිවස්ටන්, පිටවල පතන හා සේර ඇල්ල ද දඹුල්ල පන්සල, දඹුල්ල අන්තර් ජාතික ක්‍රීඩාංගණය, කන්ඩලම වැනි සංචාරක හෝටල් අතර මැද මොරගහකන්ද - කළුගඟ ජලාශ පිහිටීමත් සමඟ සංචාරක ප්‍රවර්ධනය ද ඉතාමත් ඉහළ මට්ටමකට ළඟාවිය හැක.

## වක්‍ර ප්‍රතිලාභ

නවීන මාර්ග ඉදිවීම, විදුලිය සැපයීම, අධ්‍යාපන පහසුකම් සැලසීම, සැලසුම්ගත නගර නිර්මාණය, පොදු ජල පහසුකම් සැපයීම තුළ ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය අපේක්ෂා කරයි.

ජලාශ ඉදිවීම හා පරිසර පද්ධතිය කළමණාකරණය වීම තුළ පාරිසරික සංචාරක ව්‍යාපාතීන් ක්‍රියාත්මක වීම හා රැකියා අවස්ථා නිර්මාණය වීම සිදු වේ.





## වයඹ ඇළ සංවර්ධන ව්‍යාපෘතිය

- සංවර්ධනය වන මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 12500
- කුරුණෑගල දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව 06
- මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02
- වියදම ඩොලර් මිලියන 200 යි. (රුපියල් මිලියන 30,000)
- ආයෝජන ආසියානු සංවර්ධන බැංකුව (ADB)
- ප්‍රධාන ඇළ - කි.මී. 93
- පොල්පිතිගම වැනි දුෂ්කර ප්‍රදේශවල යලමහ දෙකන්නයට ජලය සැපයීම
- ගොවි පවුල් 13,500කට ස්ථිරවම යලමහ දෙකන්නයට ජලය සැපයීම
- ප්‍රදේශයේ ගොවි පවුල් 40,000 කට (ලක්ෂ දෙකක ජනතාවට) පිරිසිදු පානීය ජල පහසුකම් සැපයීම



## මොරගහකන්ද සංවර්ධනයේ ප්‍රතිලාභ මැදිරිගිරියට

- මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශයේ අලුතින් පදිංචි කරන ගොවි පවුල් සංඛ්‍යාව-3240
- පවුල් 3240 කට ගෙවතු ඉඩම්
- පළමු අදියර යටතේ හෙක්ටයාර් 2000කට දියවර පහසුකම්
- වැව් 32ක් පිළිසකර වේ
- සම්පූර්ණ සංවර්ධන ප්‍රදේශයේ ප්‍රධාන ඇළ කි.මී. 16.5
- සෙසු ඇළ මාර්ග කි.මී. 59 ක් සංවර්ධනය
- නාගරික සේවා පහසුකම් වැඩි දියුණු කිරීම
- මැදිරිගිරිය බිසෝපුර කන්තලේ පේරමඩුව මහාමාර්ගය කි.මී. 23 ක් සංවර්ධනය
- අක්කර 100ක කර්මාන්තපුරයක්

REFERENCE

ආදී වශයෙන් වූ මැදිරිගිරිය නව සංවර්ධන කලාපයක් ලෙස වැඩිදියුණු කිරීම.

මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතියේ
මහජන සම්බන්ධතා අංශය මගින්
ව්‍යාපෘතියේ ආරම්භය, ඉදිකිරීම, ප්‍රගතිය හා ප්‍රතිලාභ
පිළිබඳ මතු පරපුර දැනුවත් කිරීම









අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි
පාසල් සිසුන්, ගොවි සංවිධාන, ස්වේච්ඡා සංවිධාන
සහ වෘත්තිකයන් වෙත ව්‍යාපෘතියේ තාක්ෂණික ඉදිකිරීම් කටයුතු,
පරිසර සංරක්ෂණ කටයුතු, සංචාරක ප්‍රවර්ධන කටයුතු,
ජලාශ බිමෙන් ඉවත් කරන ජනතාව නැවත පදිංචිකර
පහසුකම් සැපයීමේ කටයුතු,
ජාතික ආහාර සුරක්ෂිතතා වැඩසටහන සමඟ
තිරසාර සංවර්ධනයකට
මෙම ව්‍යාපෘතිය මඟින් ලැබෙන යෝධ ශක්තිය පැහැදිලි කෙරේ.



## මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ සුවිශේෂී ප්‍රතිලාභ

- මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල ඇ.ඩො.මි. 557.42
- ඉහළ ඇළහැර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල ඇ.ඩො.මි. [illegible]
- වයඹ හෙක්. 12,000 සංවර්ධනය සඳහා ඇ.ඩො.මි. [illegible]
- මාතලේ, අනුරාධපුර, පොලොන්නරුව දිස්ත්‍රික්ක සඳහා වගා කළ හැකි හෙක්ටයාර 82,000කට තිරසාරව දියවර සැපයීම
- දැවෙන ප්‍රශ්නයක් වන වකුගඩු රෝගයට පිළියමක් ලෙස පානීය ජලය සහ කර්මාන්ත සඳහා ජලය සැපයීම
- පවුල් 130,000කට පමණ තිරසාර ආර්ථිකයක් නිර්මාණය කිරීම.
- මෙ.වො.25 විදුලිබල නිෂ්පාදනය
- වාර්ෂිකව මෙ. වො. 3,000කට ඉක්ම වූ [illegible] නිෂ්පාදනයක් ජාතික ආර්ථිකය සඳහා එක් කිරීම.
- පරිසර සංරක්ෂණ සමග සංචාරක කර්මාන්තයට හොඳ පසුබිමක් නිර්මාණය කිරීම.
- සෞඛ්‍ය, අධ්‍යාපන, විදුලිය, පානීය ජලය, සන්නිවේදන, මහාමාර්ග, වාරිමාර්ග සංවර්ධනය
- රාජ්‍යසේවා සහ පෞද්ගලික සේවා ප්‍රදේශයට සංකේන්ද්‍රනය කිරීම.
- ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදන සඳහා වඩා හොඳ වෙළඳපලක් නිර්මාණය කිරීම.
- ප්‍රදේශයේ තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථාවන් පුළුල් කිරීම.
- මෙම ප්‍රදේශයට වර්ෂාපතනයෙන් ලැබෙන ඝණ මීටර් මිලියන 818 ක ධාරිතාවය මුහුදට ගලා යාම වළකා මෙම ජලාශයේ රඳවා ගැනීම මඟින් මනම්පිටිය, සෝමාවතිය ප්‍රදේශයට වාර්ෂිකව ඇතිවන ගංවතුර හානි අවම කරලීම.











# පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික පසුබිම

අතීත රජ දවස (ක්‍රි.ව. 67 - 111 වසභ රජ සමය) එවකට සිටි ජනතාවට සෑහෙන පරිද්දෙන් අඹන් ගඟ හරස් කරමින් ඇළහැර අමුණ ඉදිකර ඇළහැර - මින්නේරිය යෝධ ඇළ ක්‍රියාත්මක කරවා ගිරිතලේ, මින්නේරිය, කවුඩුල්ල, කන්තලේ සිට ත්‍රිකුණාමලය දක්වා මහසෙන් රජු හා 11 අග්බෝ රජුගේ දායකත්වයෙන් අතීත වාරි ශිෂ්ටාචාරය එදා සිට අද දක්වා ක්‍රියාත්මක වේ. එසේම අඹන් ගඟ ඇළහැරින් ද හරස් නොවී තවත් කොටසක් ගලායන විට එයට කළුගඟේ ජලයත් එක්කාසුව පහළට ගමන් කරනවිට අංගමැඩිල්ල ප්‍රදේශයේ දී හරස්කර පරාක්‍රම සමුද්‍රය වෙත ජලය ගෙනයාමත් පරාක්‍රමබාහු රජ දවස සිදුවිය.

මෙලෙස ක්‍රියාත්මක වූ අතීත වාරි ශිෂ්ටාචාරයට නව පණත් ලබාදෙමින් වර්තමාන ජල ගැටළුවට විසඳුම් සොයන මොරගහකන්ද ජලාශය ඉපැරණි ඇළහැර අමුණට කිලෝ මීටරයක් පමණ ඉහළින් ඉදිවේ.

මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය නිසා ජලයෙන් යටවන මැදකිඳ - වෙහෙරගොඩැල්ල, තලාගොඩ, මුරුංගාවත්ත, ඇලගමුව, රදාවෙල යන ප්‍රදේශවල තිබූ ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානයන් මෙම ව්‍යාපෘතියේ දායකත්වයෙන්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් කැණීම් සිදුකර සංරක්ෂණයකර ඇත. (මෙම සංරක්ෂණ කටයුතු වෙනුවෙන් ව්‍යාපෘතිය රුපියල් මිලියන 4.6 කට වැඩි මුදලක් වැය කර ඇත.) එහිදී හමුවූ පුරාවස්තු ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය අසල ඉදිකරනු ලබන කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කිරීමට නියමිත අතර එමඟින් මතු පරපුරට අධ්‍යනයන් හා ගවේෂණයන්ට ද දොරගුළු විවරවනු ඇත.

## පාරිසරික කළමනාකරණ සැලසුම්

පාරිසරික කළමනාකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම ද ව්‍යාපාතියේ වැදගත් අංගයකි.



1. මොරගහකන්ද ජලධාරා ප්‍රදේශයෙහි ගංගා, ඇළ දෙළ රක්ෂිතයන් හෙක්. 1,365 ක පමණ නැවත වන වගා කිරීම.

2. මොරගහකන්ද ජලාශය වටා මීටර් 100 ක රක්ෂිත ප්‍රදේශයන් වෙන් කිරීම හා එහි හෙක්. 650 ක නැවත වන වගා කිරීම.

3. මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය හා වස්ගමුව ජාතික වනෝද්‍යානය අතර අලිමංකඩක් වෙන් කිරීම.

   (අ) අලිමංකඩ දෙපස විදුලි වැටවල් පිහිටුවීම.
   (ආ) අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කරවීම.

4. මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය හා වස්ගමුව ජාතික වනෝද්‍යානයේ සත්ත්ව වාසභූමි වැඩි දියුණු කිරීම.

   (අ) අත්හැර දමන ලද වැව් 04 ක් [illegible]
   (ආ) ආක්‍රමණශීලී පැළෑටි ඉවත් කර [illegible] වගා කිරීම.


### පාරිසරික කළමනාකරණ ක්‍රියාත්මක වැඩසටහන්

[illegible] කාර්යයන් හේතුවෙන් ඇති විය හැකි අයහපත් පාරිසරික බලපෑම් අවමකරලීම සඳහා පාරිසරික කළමනාකරණ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම ව්‍යාපාතියේ වැදගත් අංගයකි.

[illegible] පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ (EIA Report) නිර්දේශයන් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.



- ජල පෝෂකයේ නව වගාවන් හා පෝෂණීය වගාවන් හෙක්. 2000 ක් පමණ ඇති කිරීම.
- පාංශු සංරක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ග්‍රාමීය කෘෂිකාර්මික යටිතල පහසුකම් දියුණු කිරීම.
- වන අලි තර්ජනය අවම කරලීම සඳහා අලිමංකඩවල් ස්ථාපිත කිරීම, විදුලි වැට ඉදිකිරීම හා වනජීවී වාසස්ථාන වැඩිදියුණු කිරීම.
- ජෛව විවිධත්ව (ශාක හා සත්ව) ආරක්ෂණ හා සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන හඳුනාගැනීම, ආරක්ෂණය හා සංරක්ෂණ කාර්යයන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීම.
- ඉදිකිරීම් කාර්යයේ දී ස්ථානීය පාරිසරික ආරක්ෂණ කටයුතු
- නව ජනපදිකයින්ගේ කෘෂිකාර්මික ප්‍රවර්ධනය සඳහා ගුරුවෙල ආදර්ශන හා පුහුණු ගොවිපළ ආරම්භ කර පවත්වාගෙන යාම.



මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙන් දියවර සපයන
යෝජිත ඉහල ඇලහැර ව්‍යාපෘතිය
දියවර සැපයීම හෙක්ටයාර් 82,000
ප්‍රතිසංස්කරණය වන ඇල මාර්ගය
යෝජිත ඇල මාර්ග
යෝජිත උමං ඇල මාර්ගය
I/M
මහකනදරා වැව
කන්තලේ වැව
අල්ලෙයි වැව
නුවර වැව
I/H
M/H
නාච්චදූව වැව
ඒරු වැව
හුරුළු වැව
අන්ගමුව වැව
මානන්කට්ටිය වැව
රාජාංගන වැව
H
කැටියාව වැව
කවුඩුල්ල වැව
මහ ඉලුප්පල්ලම වැව
මැදිරිගිරිය නව සංවර්ධන ප්‍රදේශය
මින්නේරිය වැව
සියඹලාගමුව වැව
කලා වැව
ගිරිතලේ වැව
D2
බළලු වැව
ජලාශය
හරකාඇළ වැව
වඩමුනයි වැව
B
කන්ඩලම වැව
පරාක්‍රම සමුද්‍රය
දඹුලු ඔය ජලාශය
ගිරිතලේ මින්නේරිය නැ.පා.
G
දේවහුව වැව
හක්වටුනා ඔය ජලාශය
වැමැදිල්ල ජලාශය
වස්ගමුව ජාතික උද්‍යානය
පිඹුරත්තෑව වැව
එන්.ඩී.කේ. රක්ෂිතය
නාලන්දා ඔය ජලාශය
මොරගහකන්ද රක්ෂිතය
C
මාදුරු ඔය රක්ෂිතය
බෝවතැන්න ජලාශය
E
කළු ගඟ රක්ෂිතය



REFERENCE
ජනාධිපති කාර්යාලයේ
පුස්තකාලය

## පරිසර සංරක්ෂණය සඳහා ප්‍රමුඛතාව

මොරගහකන්ද හා කළුගඟ ජලාශ ඉදිකිරීමේ දී ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ද ප්‍රමුඛතාවයක් ලබාදුනි. මෙම වැඩසටහනේ පළමු අදියර ලෙස ජලාශ පත්ල ප්‍රදේශයේ පිහිටි සියළුම දුර්ලභ ඝනයේ ශාක ගලවා සුදුසු ස්ථානවල නැවත ස්ථාපනය කිරීමට කටයුතු කෙරිණි. මෙම වැඩසටහන් වඩාත් විද්‍යාත්මක පදනමකින් සිදුකල අතර, මේ සඳහා ජාත්‍යන්තර ස්වාභාවික සංරක්ෂණ ආයතනයේ (IUCN) සහාය ලබා ගන්නා ලදී.

ජෛව විවිධත්ව සංරක්ෂණයේ 2 වන අදියර වූයේ මොරගහකන්ද ජලාශය ප්‍රථම වරට ජලයෙන් පිරවීමේ දී ජලාශ පත්ලේ වෙසෙනු ලැබූ සතුන් ආරක්ෂාකාරීව ගොඩබිම වෙත මුදාහැරීමේ කාර්යයයි. මෙය ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කළ වැඩසටහනකි. ජලාශය පිරවීම ආරම්භයේ සිට මේ දක්වා සතුන් 2500 කට ආසන්න ප්‍රමාණයක් ආරක්ෂාකාරීව මුදවාගත් අතර, ඔවුන් කිසිවෙක් මියයාමට ලක් නොවුනි. එයද ව්‍යාපෘතිය විසින් අත්කරගත් එක් පාරිසරික ජයග්‍රහණයකි.





මොරගහකන්ද
කළු ගඟ ව්‍යාපාතියට අදාළ
ව්‍යාපාතීන්
එළඹුනු සුභ මොහොතින්
අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින්
ආරම්භ කළ අවස්ථාවන්......








මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - මහජන සම්බන්ධතා ඒකකය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
Ministry of Mahaweli Development & Environment - Public Relation Unit
Mahaweli Authority of Sri Lanka, Moragahakanda-Kaluganga Development Project

ව්‍යාපෘති අධ්‍යක්ෂ : 066-2053601 / ෆැක්ස් : 066-2053606 මහජන සම්බන්ධතා නිලධාරී : 066-2053632
moragakandamahaweli ඊ-මේල් : (mkdpprunit@gmail.com) වෙබ් අඩවිය : (www.mahaweli.gov.lk)


Find us on facebook moragakandamahaweli

Printed at Bolin & Co.(Pvt) Ltd